වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
ANNUAL REPORT
2006

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
இலங்கை போக்குவரத்துச் சபை
SRI LANKA TRANSPORT BOARD

අංක 200, කිරුළ පාර - නාරාහේන්පිට - කොළඹ 05
இல:200, கிருல வீதி, நாராஹேன்பிட்ட, கொழும்பு 05
No: 200, Kirula Road, Narahenpita, Colombo 05

වාර්ෂික වාර්තාව

2006

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

පටුන

1. දැක්ම, මෙහෙවර, අරමුණ හා පරමාර්ථ

2. හැඳින්වීම

3. සභාපතිතුමාගේ පණිවිඩය

4. 2006 තුල කාර්යසාධනය සහ ප්‍රගති සමාලෝචනය

5. අවසාන ගිණුම්

6. විගණකාධිපති වාර්තාව

දැක්ම

කලාපයේ විශිෂ්ඨතම මගී ප්‍රවාහකයා

මෙහෙවර

මහජනතාවට ආරක්ෂිත, විශ්වාසදායි, සුවපහසු මර්ගස්ථ මගී ප්‍රවාහන සේවයක් සාධාරණ ගාස්තු ක්‍රමයක් යටතෙ සේවයට කැපවූ ඵලදායි කාර්ය මණ්ඩලයක් මගින් ආයතනයේ සියළුම සම්පත උපරිම ප්‍රයෝජනයට ගනිමින් ආර්ථිකමය වශයෙන් තුලනාත්මකව පවත්වාගෙන යාම.

අරමුණු හා පරමාර්ථ

1. ප්‍රාදේශිය කාර්යාල 12 මගින් ඩිපෝවන් සඳහා උපදෙස් දමත් ප්‍රධාන කාර්යලය හා සම්බන්ධීකරණය කිරීම මගින් ගුණාත්මක ප්‍රමාණාත්මක සහ කාර්යක්‍ෂමව හා ඵලදායි බස් සේවාවක් සැපයිම පිණිස කටයුතු ප්‍රවර්ධනය කිරීම.

2. පාසල් යන ළමයින් සඳහා සතුටුදායක බස් සේවාවක් සැපයිම.

3. මුල්‍යමය ප්‍රතිලාභ නොමැතිවීම හේතුකොට ගෙන පෞද්ගලික බස්රථ ධාවකයින් විසින් අතහැරදමා ඇති ආදායම්නොලබන මාර්ගවල බස් සේවා යෙදවීම.

4. කොටුව මධ්‍යම බස් නැවතුම් පොලේ සිට දුර පළාත් වලට දුර ගමන් සේවා සැපයිම.

5. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ප්‍රවාහන නියෝජිත ආයතන සම්බන්ධීකරණය කිරීම.

6. උතසව, විශේෂ අවස්ථා, පාර්ලිමේන්තු/පළාත් සභා මැතිවරණ ආදිය වැනි අවස්ථාවන්වලදී බස් සේවා සම්බන්ධීකරණය කිරීම.

7. තැපැල් සහ පුවත්පත් ප්‍රවාහනය කිරීම.

8. බස් ධාවනය සම්බන්ධයෙන් පොකුරු බස් සමාගම්, මහා භාණ්ඩාගාරය, ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව, පළාත් සභා අදාල අමාත්‍යාංශ සහ අනෙකුත් අදාල නියෝජිත ආයතන සමග සම්බන්ධීකරණය කිරීම.

9. ශ්‍රී ලංගමයේ රියදුරු පුහුණු පාසැල්වලින් මනා පුහුණුව ලැබූ විනයගරුක රියදුරන් සැපයිම.

10. රියදුරන්, කොන්දොස්තරවරුන්, යාන්ත්‍රික ශිල්පින් සහ අධීක්‍ෂණ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම.

11. ප්‍රාදේශිය වැඩපොළවලින් නිෂ්පාදනය කරනු ලබන කට්ටල/ උප කට්ටල ඩිපෝවන් වෙත සැපයිම.

12. සිත්ගන්නා සුළු අඩුකල මිල ගණන් වලට වැඩිහිටියන් සහ ශිෂ්‍යයන් සඳහා වාර ප්‍රවේශපත්‍ර ලබාදිම.

13. පළාත් වැඩපොළවල් සඳහා ඉතා වැදගත් අමතර කොටස් නිකුත් කිරීම සඳහා නාරාහේන්පිට ශ්‍රී ලංගම පධාන කාර්යාලයේ මාර්ගස්ථ ගබඩාවෙන් පවත්වාගෙන යාම.

14. ඩිපෝවන් වල බස් ධාවනය සම්බන්ධයෙන් ආරක්‍ෂක විමර්ශන, හදිසි වැටලිම් සෝදිසි කිරීම් ආදිය පැවැත්වීම.

හැඳින්වීම

සියලුම ආකාරයේ ප්‍රවාහන මධ්‍යයන් රටේ ආර්ථික සංවර්ධනය සලකා නිසැකවම අත්‍යාවශ්‍ය වේ. මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් එය විශේෂයෙන්ම අත්‍යවශ්‍යවන්නකි. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක නගර සහ ග්‍රාම සම්බන්ධතාවය පවත්වාගැනීම පිණිස බස් සේවාව වැදගත් මෙහෙයක් ඉටුකරන අතර මුළු මහත් රටේම ඒකාබද්ධතාවය එමගින් ඇතිකරයි.

මාර්ග 1200 කට පමණ සම්පූර්ණයෙන් බස්රථ ධාවනය කරන ලද බස්රථ ධාවකයන් 80 දෙනෙකු පමණ විසින් දිවයින පුරා සපයන ලද බස් සේවා ද ලියාපදිංචි කල බස්රථ 3532 ක් ද 1957.10.31 දින 1957 අංක 48 දරණ මෝටර් රථ ප්‍රවාහන පනත මගින් ජනසතු කරන ලද අතර ඒ අනුව ලංකා ගමනාගමන මණ්ඩලය (ලං.ග.ම) 1958.01.01 දින සිට ක්‍රියාත්මක විය.

එවක් පටන් 1977 වර්ෂය දක්වා මාර්ගස්ථ මගී ප්‍රවාහනය සම්බන්ධයෙන් ලං.ග.ම ඒකාධිකාර්ත්වයකින ක්‍රියාත්මක වූයේය. 1978 අංක19 දරණ ගමනාගමන මණ්ඩල ව්‍යවසථා මගින් ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය මගින් සම්බන්ධීකරණය කරනු ලබන ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩල 10 ක් පිහිටුවා 1978 දි ලංගම විමධ්‍යගත කරන ලදි. ප්‍රදේශයේ සහ පළාතේ අවශ්‍යතා පිළිබඳ වැඩි වශයෙන් සංවේදිවීමටත් ප්‍රදේශයේ ප්‍රවාහන ගැටළු සඳහා ක්‍ෂණික විසදුම් ලබාදීමටත් කුඩා ඒකකවලට හැකිවන බව අපේක්‍ෂා කල බැවින් ලං.ග.ම විමධ්‍යගත කිරීමෙන් මගී ජනතාවගේ අවශ්‍යතා වඩා කාර්‍යක්‍ෂම හා ඵලදායි ලෙස ඉටු කිරීමට හැකි වෙතැයි රජය අදහස් කළේය.

කෙසේ වුවද ලං.ග.ම විසින් දරන ලද පාඩු දිගින් දිගටම වැඩිවීම නිසාත් නිදහස් ආර්තිකය පිළිබඳ නව සංකල්ප නිසාත් දිගින් දිගටම වැඩිවෙමින් පැවති මගී ඉල්ලුම සපුරාලීමට නොහැකිවීම නිසාත් මගින් ප්‍රවාහනය කිරීම සඳහා පෞද්ගලික අංශයට ද අවසර ලබාදෙන ලදි.

රජයේ දැඩි විශ්වාසයකින් පෞද්ගලිකරණය මගින් රාජ්‍ය අංශය පතිව්‍යුහගත කිරීමේ කොටසක් වශයෙන් ලං.ග.ම ජනතාකරණය කිරීමට කටයුතු කළේය. 1987 අංක 23 දරණ රජයේ සංස්ථා හෝ රජය සතු ව්‍යාපාර පොදු සමාගම් බවට පත්කිරීමේ පනත යටතේ ලංගම ජනතාකරණය කරන ලදි. ජනතාකරණය සිදු කල අවස්ථාවේදි පැවති ගමනාගමන මණ්ඩලය ඩිපෝ 93ක් වෙන් වෙන් වශයෙන් සීමාසහිත සමාගම් බවට පත්වූ අතර එම සමාගම් පාලන කිරීම් සඳහා සේවකයන් අතුරෙන් අධ්‍යක්‍ෂ මණ්ඩලයක් තෝරාගන්නා ලදි. එම සමාගම්වල සම්පූර්ණ කොටස් ප්‍රමාණයෙන් අඩක් කාර්ය මණ්ඩලය වෙත බෙදාදෙන ලද අතර ඉතිරි කොටස් මහ භාණ්ඩාගාරය සතුවිය. ජනතාකරණ වැඩසටහන 1990 වර්ෂයේදි ආරම්භකර 1993 වර්ෂයේදි අවසන් කරන ලදි. ජනතාකරණය අවිධිමත් ලෙස ක්‍රියාත්මක කල බැවින් අපේක්‍ෂා කල ප්‍රතිඵල අත්නොවිය.

1991 අංක 37 දරණ ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමෙන් ඉහත ඩිපෝ ඒකාබද්ධ කර පොකුරු බස් සමාගම් පිහිටුවන ලදි. සේවක අතිරික්තයන්, විනය බරපතලසේ බිඳවැටීම, අසාධාරණ තරඟකාරීත්වය, පාසැල් සේවාවන්, අනාර්ථික සේවාවන් වැනි සමාජමය මගකිම, වෘත්තිමය දැනුමක් ඇති අයගේ හිඟය, අකාර්යක්‍ෂමතාවය, ධාවනය වැය ඉහල යෑම, දේශපාලන හා වෘත්තිය සමිති අනිසි බලපෑම් හා පැතිරී ගිය දූෂණයන් පොකුරු බස් සමාගම් බිඳවැටීමට හේතු වූ සමහර කරුණු වේ.

මෙම ප්‍රශ්ණයට විසඳුමක් වශයෙන් ''2005 අංක 27 දරණ ශ්‍රී ලංකා ගමනාගමන පනත'' මගින් ශ්‍රී ලංකා ගමනා ගමනමණ්ඩලය 2005.10.19 පිහිටුවන ලදි.

සභාපතිතුමාගේ පණිවිඩය

2006 වර්ෂය ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට විශේෂ වන්නේ, එතෙක් පැවති පොකුරු බස් සමාගම්, ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය, ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල, වැනි ලංගමට සම්බන්ධ සියළුම ආයතන එක්කාසු කරමින් 2005.10.19 දින පිහිටවූ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සම්පූර්ණ වර්ෂයක් හැටියට ක්‍රියාත්මක වූ පලමු වර්ෂය නිසාය. ඒ අනුව නැවත වරක් සියළුම සේවකයින්ගේ කටයුතු හා රාජ්‍ය බස් ව්‍යාපාරය මෙහෙයවීම තනි ආයතනයක් යටතට පත්වීම සේවකයින් බලාපොරොත්තුව සිටි අවස්ථාවක් ලෙසද හැඳින්විය හැක. මගී ජනතාව පැත්තෙන් ගත් විටද, මෙම වෙනස්වීම ගැන ලොකු පැහැදීමක් තිබෙන බවක් හා විශ්වාසයක් ගොඩනගාගත් බවක් පෙනෙන්නට තිබිණ.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවීම, කාලයේ අවශ්‍යතාවයට අනුව ගත් තීන්දුවක් වන අතර, ඒ සමගම ආයතනය තුල ලොකු පිබිදීමක් දක්නට හැකි විය. බස්රථ පරිසිදුව තබා ගැනීමට කටයුතු කිරීම, ගමනාන්ත පුවරු නිසිලෙස සකස් කිරීම, සියළුම බස්රථවල වර්ණය රතුපාට ලෙස වෙනස්වීම ප්‍රධාන තැනක් ගත් අතර, බස්රථවල කිසිදු දැන්වීමක් පල නොකිරීමට ගත් තීන්දුවද අගය කලයුතු තත්වයේ විය.

ජාතියේ ගමන් සගයා හැටියට මහජනතාවට වඩාත් සමීප සේවාවක් සලසනුවස් සේවකයින්ගේ උවමනාව හා කැපවීමද මෙහිලා සඳහන් කල යුතුය. මන්ද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය දිනෙන් දින ලබාගත් දියුණුව සියළු දෙනාගේම සහභාගිත්වය මත සිදු වූවක් බැවිනි.

මහජනතාවට ලබාදුන් සේවාව ගැන සඳහන් කිරීමේදී, 2005 වර්ෂයේදී ඉතාමත් පහත වැටී තිබූ දිනකට ධාවනය කල කිලෝ මීටර් ප්‍රමාණය වැඩිකර ගැනීමට හැකිවී තිබීම, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටු වීමේ ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැක. ඒ අනුව 2005 වර්ෂයෙදී දිනකට ධාවනය කල 679,091 ක් වූ කිලෝ මීටර්ප්‍රමාණය, 2006 වර්ෂයේදී දිනකට 713,753 ක් වශයෙන් වර්ධනය වී ඇත.

ධාවනය කරන කිලෝ මීටර් ප්‍රමාණය වෙනස් වීමට මාර්ගලේඛණ ආදායම අඩුවීමද හෝ වැඩිවීම වැලැක්විය නොහැකි නමුත්, 2005 වර්ෂයට වඩා කිලෝ මීටර් 35,000 කින් 2006 වර්ෂයේ දිනක කිලෝ මීටර් ප්‍රමාණය වැඩිවන විට මාර්ගලේඛණ ආදායම දිනකට මිලියන 4.1 කින් වැඩිවී ඇත. එය විශාල වැඩි වීමකි. මෙම කරුණු සැලකිල්ලට ගැනීමේදී සහතික කරගත හැකි වනුයේ, මහජනතාව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය කියන කීර්ති නාමයට දැඩි කැමැත්තක් දක්වන බවය.

මෙම තත්වය ආයතනය දියුණුව කරා ගෙනයාමට රුකුලක් බැවින්, මහජනතාවට හොඳ විශ්වාසනිය සේවාවක් සපයන අතරවාරයේ, ආයතනයේ දියුණුවට විශාල වැඩ කොටසක් 2007 වර්ෂයේදී කිරීමට හා එය සාක්ෂාත් කර ගැනීමට අදිටන් කර ගැනීමක් අවශ්‍යම බව සඳහන් කරමි.

ශශී වෙල්ගම.
සභාපති,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය.

සැලසුම් හා සංවර්ධන අංශය

සියළු ඩිපෝ හා ප්‍රාදේශිය කාර්යාල වල වාර්ෂික ලාභාලාභ වාර්තා එක් කොට ඒකාබද්ධ ලාභා ලාභ වාර්තා පිළියෙල කිරීම. ඒ පිළිබඳ විශ්ලේෂණ වාර්තා පිළියෙල කිරීම. ප්‍රාදේශිය කළමණාකරුවන් සමඟ සභාපතිතුමා හා සාමාන්‍යාධිකාරි තැනගේ ප්‍රධාන වශයෙන් පවත්වන පගති සමාලෝචන රැස්වීම් වලදී ඩිපෝ සංවර්ධනය සඳහා තිරණ ගැනිම මෙම වාර්තා බෙහෙවින් ප්‍රධාන වශයෙන් උපයෝගි කරගෙන ඇත.

ත්‍රෛයි මාසික බැරකම් වාර්තා, අනතුරු වාර්තා පිළියෙල කිරීම හා අනාර්ථික මාර්ගවල ප්‍රතිදාන ලබාගැනිම සඳහා අවශ්‍ය වාර්තා පිළයෙල කර ප්‍රවාහන කොමිසම වෙත ඉදිරිපත් කිරීම. ටයර් පරිභෝජනය හා ටයර් ධාවන කිලෝමීටර් පිළිබඳ වාර්තා පිළියෙල කිරීම, රියදුරු පාසැල්, ප්‍රාදේශිය වැඩපලවල්, සංචාරක බංගලා යනාදියේ ලාභා ලාභ වාර්තා පිළියෙල කිරීම. එයින් ඒවායේ ප්‍රගතිය මැන බැලීම හා ගත යුතු ක්‍රියා මාර්ග ගැනිමට මෙම වාර්තා උපයෝගි වී ඇත.

අභ්‍යන්තර විගණන අංශය

2006 වර්ෂයේ නිකුත් කර ඇති විගණන විමසුම් සංඛ්‍යාව 1001 කි. ඒ තුලින් අයවීමට ඇති මුදල රු.7,275,224.81 කි.

ලේකම් කොට්ඨාශය

2006 වර්ෂය තුල නිතිපතා අධ්‍යක්‍ෂ මණ්ඩලය රැස්වූ අතර එකී වර්ෂය තුල රැස්වීම් වාර 10 ක් පවත්වා ඇත.

ටෙන්ඩර් මණ්ඩලය

- ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය සහ ඩිපෝවන් සඳහා අවශ්‍ය මුද්‍රණ කටයුතු සඳහා මිල කැඳවා මිලදී ගැනිමට අවශ්‍ය කටයුතු සලසා දිම.
- ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලය සහ ඩිපෝවන් සඳහා අවශ්‍ය කාර්යාලිය උපකාරණ (භාණ්ඩ) මිලදී ගැනිම සඳහා මිලගණන් කැඳවිම සහ මිලගණන් ලබාදිම.
- ඩිපෝවන් සහ ප්‍රාදේශිය වැඩපල සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනිම සඳහා මිල ගණන් කැඳවිම සහ අදාල මිලගණන් ලබාදිම.
- සිවිල් ඉංජිනේරු කාර්යයන් සඳහා මිල ගණන් කැඳවිම.
- අබලි බස්රථ, අබලි ද්‍රව්‍ය ආදි භාවිතයෙන් ඉවත් කරන ද්‍රව්‍ය අපහරණය කිරීම සම්බන්ධ සියලු කාර්යයන් සිදු කිරීම.

ආරක්ෂක අංශය

- ශ්‍රී ලංගම අයත් ප්‍රදේශිය කාර්යාලයන් ඩිපෝවන්, උප ඩිපෝවන්, ප්‍රාදේශිය වැඩපලවල් හා රියදුරු අභ්‍යාස විද්‍යාලයන සියලුම සේවා ස්ථානයන්ට අයත්ව ඉදිරිපත් කරන ලද ලිඛිත පැමිණිලි හා මගී ජනතාව මගින් ඉදිරිපත් කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශණය සිදු කිරීම.

- ගිනි නිවීම් කටයුතු සිදු කිරීම.

- 2006 වර්ෂය තුල කරන ලද විමර්ශණ ප්‍රමාණය 250 ක් පමණය.

- ශ්‍රී ලංගම අයත් නඩු ඇපකරයන් වලට මුදල් බැදීම හා ප්‍රධාන කාර්යාලය සතුව කෙරෙන මූල්‍ය කටයුතු සඳහා දෛනික වශයෙන් ආරක්ෂාව ලබාදීම.

- ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයේ ඇතුලු සියලුම සේවා ස්ථානයන්වල සේවක මහත්ම/ මහත්මීන්ට සෘජුව නිදහස් ගමන් බලපත්‍ර නිකුත් කිරීම.

වාණිජ හා සම්පාදක කොට්ඨාශය

වර්ෂ 2006 වන විට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් සයලුම ප්‍රාදේශිය වැඩපොලවල සහ ප්‍රාදේශික සඳහා අවශ්‍ය අමතර කොටස්, ටයර්, බැටරි නිකුත් කිරීම සම්පාදක කොට්ඨාශය මගින් සිදු කරනු ලැබීය. මෙම කාර්යය ඉටු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ පිහිටුවා ඇති ප්‍රධාන ගබඩාවක්, කටුබැද්ද මධ්‍යම ගබඩාවක් උපයෝගි කරගන්නා ලදි.

විශේෂයෙන්ම නව එන්ජින් කට්ටල ගබඩා කර නිකුත් කිරීම් කටයුතු කටුබැද්ද මධ්‍යම ගබඩාවෙන් ඉටු කරන ලදි.

සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුල ඩිපෝ, ප්‍රාදේශික සහ ප්‍රාදේශිය වැඩපොලවල් වලට නිකුත් කරන ලද අමතර කොටස් වල වටිනාකම.

වර්ෂය	මධ්‍යම ගබඩාව කටුබැද්ද	ප්‍රධාන ගබඩාව නාරාහේන්පිට	එකතුව
2006	රු. 92,896,796.00	රු. 42,754,112.67 (අමතර කොටස්) රු. 129,990.00 (ටයර් කිට්) රු. 112,500.00 (බැටරි)	රු. 42,996,602.67



ධාවන කොට්ඨාශය

විස්තරය	2004	2005	2006
බස්රථ ඇණිය	8,436	8,455	8,852
ධාවන තත්වයේ පවතින බස්රථ	4,648	4,646	4,077
ධාවනය කල බස්රථ ගණන	4,133	3,673	3,776
ධාවනය කල බස්රථ, ධාවනය කල හැකි ඇණියේ ප්‍රතිශතයක් ලෙස	88%	79%	93%
ධාවනය කල බස්රථ, රථ ඇණියේ ප්‍රතිශතයක් ලෙස	49%	43%	43%
ධාවනය කල මුලු කි.මීටර් ගණන	285,380,970	247,868,440	260,519,895
මුලු ආදායම	8,999,260,896	10,007,350,024	12,668,277,951
මාර්ගලේඛණ ආදායම	6.030,446,074	6,416,986,740	7,917,292,095
මාර්ගලේඛණ ආදායම මුලු ආදායමේ ප්‍රතිශතයක් ලෙස	67%	61%	62%
කිලෝ මීටරයට ආදායම	31.50	40.30	48.63
කිලෝ මීටරයට වියදම	35.49	46.53	52.40
ලාභය/අලාභය	-3.99	-6.23	-3.77

1. දිනකට ධාවනය කරන කිලෝ මීටර් ප්‍රමාණය

වර්ෂය	දිනකට ධාවනය කල කිලේ මීටර් ප්‍රමාණය
2004	779729
2005	679091
2006	713,753



2. දිනකදී බස්රථයකන් ලබන කිලෝමීටරයක උපයෝගීතාව

වර්ෂය	දිනකදී බස්රථයක උපයෝගීතාව
2004	කිලෝ මීටර් 189
2005	කිලෝ මීටර් 184
2006	කිලෝ මීටර් 189

3. දිනක මාර්ගලේඛණ ආදායම

වර්ෂය	දිනක සාමාන්‍ය මාර්ගලේඛණ ආදායම
2004	රු. 16,476,629
2005	රු. 17,580,786
2006	රු. 21,691,211



4. දිනක සාමාන්‍ය වාර ප්‍රවේශපත්‍ර ආදායම

වර්ෂය	දිනක සාමාන්‍ය වාර ප්‍රවේශපත්‍ර ආදායම
2004	රු. 737,779
2005	රු. 780,646
2006	රු. 544,749



කාර්මික අංශය

ප්‍රාදේශීය වැඩපල මගින් සිදුකල නිෂ්පාදන වටිනාකම

වර්ගය	ඒකකය	වටිනාකම (රු)
එංජින්	663	69,615,000.00
ගියර් කට්ටල	411	18,289,500.00
ඇක්සල	135	6,750,000.00
බස්රථ වල බඳ අලුත්වැඩියාව	137	18,152,500.00
පොම්ප අලුත්වැඩියාව	442	3,094,000.00
ඉන්ජෙක්ටර්	1202	901,500.00
ටයර්	1415	2,971,500.00
		119,774,000.00





නව බස්රථ ලබාදීම

2006 වසරේ නව බස්රථ 960 ක් ලබාදී ඇත.

ජංගම පරීක්ෂණ අංශය

මණ්ඩලයේ මාර්ග ලේඛණ ආදායම අවම වශයෙන් 25% ක ප්‍රමාණයක් සොරකම් කෙරෙන බව ගණන් බලා ඇත. එම නිසා විශේෂ පරීක්ෂණ කණ්ඩායම් යොදා ඇති අතර පහත දැක්වෙන සංඛ්‍යා ලේඛණ මගින් අහිමි වන ආදායම දක්වා ඇත.

වර්ෂය	බරපතල	සුළු පරිමාන වංචා	ප්‍රවේශ පත්‍ර නොගෙන ගමන් කල මගීන්ගෙන් අයකර ඇති දඩ මුදල
2006	1531	7609	රු. 2,082,980.50

ගිණුම් ප්‍රතිපත්ති :

1. පිළිගත් ගිණුම් සම්මතයන් හා ඓතිහාසික පිරිවැය පදනම අනුව සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කර ඇති අතර, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඒකකවල මූල්‍ය ප්‍රතිඵල ඇතුලත් කිරීමෙන් පසු ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශණ ඉදිරිපත් කර ඇත.

2. මණ්ඩලයේ ගිණුම් හා ශේෂ පත්‍රය පිළියෙල කිරීමේදී සාමාන්‍ය සම්ප්‍රදායානුකූලව පිළිගත් ගණකාධික රණ මූල ධර්මයන් අනුගමනය කර ඇති අතර, ගිණමු කාලයෙන් කාලයට ගිණුම් ප්‍රතිපත්ති සමාන ෙ ලස
යොදාගෙන ඇත. ගිණුම් කාලයට අදාල උපචය වූ ආදායම් හා වියදම් ප්‍රකාශණවල පෙන්වා ඇත.

3. ස්ථාවර වත්කම් :-
ස්ථාවර වත්කම් ශේෂ පත්‍රයේ පෙන්වා ඇත්තේ පිරිවැයෙන ක්ෂය අඩු කළ වටිනාකමයි. ස්ථාවර වත් කම්වල පිරිවැයෙන් ක්ෂය අඩුකර ශේෂ පත්‍රය පෙන්වා ඇතග කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ස්ථාවර වත්කම් නොසලකන ලදි. රු. 23,190,343/= ක් වටිනා ඉඩම් භුක්ති විඳින නමුත්, ඒවායේ අයිතිය මෙතෙක් මණ්ඩලය වෙත පැවරී නැත. ඉඩම්වල වටිනාකම ස්ථාවර වත්කම් යටතේ තබා පෙන්වානැති නමුත්, කර ඇති ගෙවීම් ස්ථාවර වත්කම් වෙනුවෙන් අත්තිකාරම් රු. 8,299,517/= ක් යනුවෙන් පෙන්වා ඇත.

4. ක්ෂයවීම් :-
මිළදී ගත් වර්ෂයේ ක්ෂය ගණනය නොකරන අතර ඉවත් කරන වර්ෂයේ සම්පූර්ණ වර්ෂය සඳහා ගණනය කරනු ලබයි. ක්ෂය ගණනය කිරීම පහත අනුපාත අනුව සරල මාර්ග ක්‍රමයට සිදුකරනු ලබ යි.

ගොඩනැඟිලි	2.5%
බස්රථ හා වෙනත් වාහන	12.5%
පිරියත හා උපකරණ	10%
ලී බඩු හා සවිකිරීම්	10%
පරිගණක	25%

5. පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදන :-
සේවකයින් විශ්‍රාම යාමේදී ගෙවීම් සඳහා සේවය කල සෑම වර්ෂයකටම අඩ මසක වේතන ප්‍රතිපාදන ය
කරනු ලැබේ. මෙය සෑහෙන හා සාධාරණ ප්‍රතිපාදනයකි.

6. අඩමාන ණයසඳහා වෙන්කිරීම :-
බොල්ණය වෙන්කිරීම් සඳහා ගණනය කිරීම් විවිධ ණයගැතියන්ගෙන් සහ වෙළෙඳ ණයගැතියන්ගෙන්

රු. 1,404,452,978.90 වන අතර අනුපාතය 5% වේ.

7. තොග අගය කිරීම් ගණනය කොට ඇත්තේ පෙර ලැබීම් පෙර නිකුත් කිරීමේ ක්‍රමය අනුවය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No. [illegible]/2006 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date 2012 දෙසැම්බර් [illegible] දින

සභාපති,
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2006 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නියමිත කාලවකවානුව තුළ විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව වූ වාර්තාවක් දැනටමත් පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි අවශ්‍ය වූ කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම් ඡේදයේ දැක්වෙන කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයාගැනීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை | No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone 2887028 - 34 | ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2887223 | ඉලෙක්ට්‍රොනික් තැපැල් / மின்னஞ்சல் / E-mail oaggov@sltnet.lk

1.4 මතය වියාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2.4, 2.2.5, 2.2.6, 2.2.7 හා 2.2.8 යන ඡේදයන්හි දක්වා ඇති කරුණු වල ප්‍රතිඵලයක් ලෙස ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ අනෙක් විෂයයන් යන මූල්‍යප්‍රකාශ වලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි නිර්ණය කිරීමට මට නොහැකිය.

1.5 සංස්ථාපනය

2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 7 වගන්තිය අනුව හා 2005 ඔක්තෝබර් 19 දිනැති අංක 1415/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රවාහන අමාත්‍යවරයාගේ නියෝගය පරිදි 2005 ඔක්තෝබර් 19 දින සිට එම පනත බලගැන්වා තිබුණ අතර, ඒ අනුව එදින සිට එවකට පැවති සීමාසහිත වාණිජකාර ජනතා සතු මගී ප්‍රවාහන සේවය, ඒකාබද්ධ ජනතා සතු බස් සමාගම් 11 ක් සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 11 ක් ගමනාගමන මණ්ඩලය වෙත පවරාගෙන තිබුණි. එසේම මෙම ආයතනවල වත්කම්ද පවරා ගැනීමට කටයුතු කර තිබුණි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මෙම වාර්තාවේ 2.2.4, 2.2.5, 2.2.6, 2.2.7 හා 2.2.8 යන ඡේදයන්හි දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2007 පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන ලද්දේ 2011 පෙබරවාරි 21 දිනදීය.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සංගම් කොටස් බැරකම් යටතේ දක්වා තිබූ රු.3,658,293 ක විශේෂණ රහිතව ඇර මුදලක් වැරදීමෙන් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ශේෂයක් ලෙස ජංගම වත්කම් යටතේ දක්වා තිබීම නිසා කාරක ප්‍රාග්ධනය රු. 7,316,586 ක් වැඩියෙන් දක්වා තිබුණි. මෙම සාවද්‍ය ගිණුම්කරණය නිසා ගිණුම්වල වූ වෙනස්කම් අවිනිශ්චිත ගිණුමකට මාරු කර තිබුණි.

(ආ) දිවයින පුරා පිහිටි පොකුරු බස් සමාගම්, සියලුම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල හා වටිනියා ජනතා සන්තක ප්‍රවාහන සේවය 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනත අනුව විසුරුවා හැර එම පනතේ 33 වගන්තිය අනුව එම ආයතනවල වටිනාකම රු. මිලියන 38,531.069 ක් වූ සියලුම වත්කම් හා බැරකම් මණ්ඩලයට පවරාගැනීමේදී එම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමක් සිදුකර නොතිබූ අතර බැරකම් පිළිබඳව නිසි තහවුරු කර ගැනීමක් සිදුකර නොතිබුණි.

(ඇ) නැගෙනහිර හා උතුරු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල එකතුව රු.21,035,665 ක්වූ ස්ථාවර වත්කම්වලට අදාළව සමුච්චිත ක්ෂය වෙන්කිරීමේ ගිණුම් පවත්වා නොතිබූ අතර, එම සමාගම් පවරා ගැනීමේදී සමුච්චිත ක්ෂය අගය නිවැරදිව ගණනය කර පවරා ගෙන නොතිබුණි. පවරා ගැනීමෙන් පසුවද මණ්ඩලය විසින් ක්ෂය වෙන් කිරීමේ ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර තිබූ අවසාන ගිණුම්වල මණ්ඩලයේ ඉඩම් හා ගොඩනැගිලිවල අගය රු.මිලියන 316.523 ක් ලෙස දක්වා තිබූ නමුත් ඉඩම්වල හා ගොඩනැගිලිවල අගය වෙන්වෙන්ව හඳුනාගෙන නොතිබුණි. කෙසේ වුවද ඉඩම්වල අගය, දක්වා තිබූ මුළු අගයෙන් 50% ක් වූ රු.මිලියන 158.261 ක් ලෙස සලකා ඒ මත සමාලෝචිත වර්ෂයේ ක්ෂය ලෙස සරල මාර්ග ක්‍රමය මත 2.5% ක් වශයෙන් රු.මිලියන 3.956 ක් ප්‍රතිපාදනය කර තිබුණි. ඉඩම් සහ ගොඩනැගිලිවල අගය ස්ථාවර වත්කම් ලේඛනයේද සඳහන් කර නොතිබූ අතර එම වත්කම් සත්‍යාපනය කිරීම සඳහා ඊට අදාළ සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 2006 වර්ෂයේ විකුණන ලද භාවිත බස්රථ 91 ක් වෙනුවෙන් ලැබූ රු. 8,295,899ක මුදල ආදායමට ගෙන තිබූ නමුත් විකුණූ බස්රථවලට අදාළ පොත්පත් සොයා ගැනීමට නොහැකි වීම නිසා බස්රථ විකිණීමෙන් වූ ලාභපාඩු ගණනය කිරීම සඳහා අවශ්‍යවන ගිණුම් සටහන් තබා නොතිබුණි.

2.2.3 නිරවුල් නොකළ ගනුදෙනු

(අ) පළුදු වූ භාණ්ඩ වෙනුවෙන් වෙන් කරන ලද රු.මිලියන 33.310 ක ශේෂයක් වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණු නමුත් අදාළ භාණ්ඩ වල විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. ඒ අන්දමින් ගිණුම්වල දක්වා තිබූ රු. මිලියන 1,446.15 ක තොගවල අගයේ නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැක.

(ආ) මුදල් රෙගුලාසි අංක 371 ප්‍රකාරව අත්තිකාරම් ලබා ගත් කාර්යය නිම වූ වහාම අත්තිකාරම් නිරවුල් කළයුතු වුවද 2005 දෙසැම්බර් 31 දිනට වූ රු. 798,223 ක විවිධ අත්තිකාරම් මුදලද, රු.4,095,073 ක් වූ මිලදී ගැනීම් අත්තිකාරම් ශේෂයන්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ක්‍රියාත්මක නොවන වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් වූ රු.මිලියන1,221.307 ක ගිණුම් ශේෂ ලියා හැරීම සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීම පිණිස 2002 ජූනි 30 දින මණ්ඩලය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අමතා තිබුණි. එම ශේෂ සම්බන්ධව සම්පූර්ණ පරීක්ෂාවක් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනීම හා අනුමැතිය මත ශේෂයන් ලියා හැරීමට යෝජනා කර තිබුණත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) 2005 ඔක්තෝබර් 18 දිනට පෙර පැවති වත්කම් හා බැරකම් ගිණුම් 05 ක ශේෂයන් පිළිවෙලින් රු.735,590,503 ක් හා රු.9,347,924,931 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුලදීද පරීක්ෂාවක් සිදු කර නිරවුල් කිරීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) ගිණුම්වල ඉදිරියට ගෙනැවිත් තිබූ රු.4,636,049.944ක වූ අවසාන ප්‍රගමන නොවන වත්කම් ශේෂය වසර 25 කට අධික කාලයක සිට පැවත එන එවා වන අතර එම ශේෂය සමාලෝචිත වර්ෂය තුළදීවත් සනාථනය කර නිරවුල් කිරීමට මණ්ඩලය පියවර ගෙන නොතිබුණි.

2.2.4 අවිනිශ්චිත ගිණුම්

ප්‍රධාන ලෙජරයට අනුව වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් තිබූ අවිනිශ්චිත ගිණුම් 10 කින් ගිණුම් 3 ක හර ශේෂවල එකතුව වූ රු.27,943,918 ක හා ගිණුම් 08 ක බැර ශේෂවල එකතුව වූ රු.391,485,225 ක අගයක් සමාලෝචිත වර්ෂය තුළදීවත් නිරවුල් කර නොතිබුණි.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) එකතුව රු. 1,845,086,728 ක් වූ ලැබිය යුතු වෙළඳ ලැබීම් ශේෂයන් අතරින් හැඳිනීමක් නොමැති පසු වර්ෂවල සිට ඉදිරියට ගෙනවිත් තිබුණු අතර ඉන් රු.104,243,094ක ශේෂ එකතුවක් වසර 22ක කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවැති ඒවා විය. ඉතිරි රු.1,740,843,634 ක ශේෂ සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. මෙම ණය අය පිළිබඳව විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) ලැබිය යුතු අරතාත් ලැබීම් ගිණුමේ ඇතුළත්ව තිබූ රු.1,373,724,561 ක විවිධ ණයගැති ශේෂය මුලු ණයගැති වටිනාකමින් 74% ක් වූ අතර ඉන් 61% ක් පමණ ප්‍රධාන කාර්යාලයට සම්බන්ධ ණයගැතියන් විය. මුදල් අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබූ අතර එම ශේෂයට අදාල කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ii) මෙඩිව ඉංජිනේරු සමාගමෙන් මණ්ඩලයට ලැබිය යුතු රු.4,360,523 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් වූ ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වියදම් රු.4,671,629,313 ක ණය හිමි ශේෂයක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ අතර, ඒ සම්බන්ධව පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) වර්ෂ 5 කට අධික කාලයක සිට පැවත එන ප්‍රධාන කාර්යාලයට අදාළ ණයහිමි ගිණුම් 10 ක ආරම්භක ශේෂවල එකතුව රු.1,219,700,516 ක් වූ අතර සමාලෝචිත වර්ෂය දක්වාම එම ශේෂ නිරවුල් කිරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. එම ශේෂ වලට අදාල මූලික පොතපත් හා ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ඉදිරියට ගෙනෙන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව පෙර වර්ෂ ගණනාවක සිට පැවත එන සේවක භාරකාර අරමුදලට බැර කළ යුතු වූ රු. 1,227,087 ක මුදලක් ණයහිමියන් යටතේ පෙන්වා තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය තුළදීවත් එය නිරවුල් කිරීමට පියවරගෙන නොතිබුණි.

2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) වත්කම් හා වගකීම් ශේෂ සනාථ නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් එවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

	විෂයය	වටිනාකම		ඉදිරිපත් නොකළ සාක්ෂි
		රු.		
(i)	ස්ථාවර වත්කම්	13,808,944,429		ස්ථාවර වත්කම් ලේඛනය
(ii)	ආයෝජන	148,896,232	(i)	ආයෝජනවල විස්තර දැක්වෙන උපලේඛන
			(ii)	ශේෂ සනාථ කිරීමේ සහතික

(iii)	විවිධ ණයගැතියෝ	1,845,086,728	(i)	ණය සනාථ කිරීමේ සහතික
			(ii)	කාල විශ්ලේෂණ
(iv)	ණය හිමියෝ	4,671,629,313	(i)	ශේෂවල ගිණුම් පිළිබඳ විස්තර
			(ii)	කාල විශ්ලේෂණ

(ආ) වත්කම් වල භෞතික පැවැත්ම තහවුරු නොකිරීම

ඩිපෝ , ප්‍රාදේශීය කාර්යාල , ප්‍රාදේශීය වැඩපලවල් , රියදුරු අභ්‍යාස විද්‍යාල හා සංචාරක නිවාසවල ස්ථාවර වත්කම්, තොග හා වෙනත් වත්කම් භෞතික සත්‍යාපනය කර තිබූ නමුත් එම වාර්තා සැලකිල්ලට ගැනීමකින් තොරව මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. එහෙයින් ශේෂ පත්‍රයේ දක්වා තිබූ රු. 6,776,263,703ක වත්කම් ශේෂවල නිරවද්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත් විය නොහැක.

(ඇ) ස්ථාවර වත්කම් පවරා ගැනීම

බස් සමාගම් 11 කට අදාළව 2005 සැප්තැම්බර් 18 දිනට ක්ෂය අඩු කළ වටිනාකම වූ රු.3,141,290,735 ක ස්ථාවර වත්කම් හා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල 7 කට අදාළව ක්ෂය අඩුකළ වටිනාකම වූ රු.370,045,232 ක ස්ථාවර වත්කම් පවරා ගෙන තිබුණු අතර මේ සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩල වාර්තා හෝ භෞතිකව සත්‍යාපනය කළ බවට සාක්ෂි හෝ ඉදිරිපත් වී නොතිබුණි.

2.2.7 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට යොමුව	අනුකූල නොවීම
(අ)	2005 අංක 17 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 33(2), (4) වගන්ති හා 24 වන වගන්තිය	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදල පරීක්ෂා කිරීම සම්බන්ධ කොමසාරිස්ගේ අනුමැතිය ඇතිව කාරක සභාවෙන් පත් කරනු ලබන ගණන් පරීක්ෂකයකු විසින් හෝ ගණන් පරීක්ෂකයින් විසින් විගණනය කළයුතු වුවත් එසේ සිදු කළ බවට සාක්ෂි හෙළිදරව් නොවීය.
(ආ)	මණ්ඩලයේ සේවක අර්ථසාධක අරමුදල් ව්‍යවස්ථා මාලාව හා 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත	සේවකයින්ගේ වැටුපෙන් අයකර ගන්නා අර්ථසාධක අරමුදල් දායකත්වය සහ ඊ මතට මණ්ඩලයේ දායකත්වය අදාළ මාසයේ අවසාන දිනට පෙර අරමුදලට බැර කළයුතු වුවද, 2006 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දායක මුදල් හා පෙර වර්ෂ වල දායක මුදල් ද ඇතුළත්ව රු. මිලියන 709.875 ක මුදලක් මණ්ඩලයේ අරමුදලට හා රු. මිලියන 229.488 ක මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලට බැර කර නොතිබුණි.
(ඇ)	1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත	සේවකයාගේ වැටුපෙන 3% කට සමාන ප්‍රමාණයක මණ්ඩලය විසින් අදාළ මාසයේ අවසාන දිනට පෙර අරමුදලට බැරකළ යුතු වුවද 2006 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දායක මුදල් හා පෙර වර්ෂවල දායක මුදල් ඇතුළත්ව රු.52,646,971ක මුදලක් එසේ බැර කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් වූ කාල විශ්ලේෂණයක් ද පිළියෙළ කර නොතිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය රු.6,971,442,683 ක ආදායමක් ලබා තිබූ අතර භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.5,325,640,367 ක ප්‍රදාන හේතුවෙන් එම ආදායම රු.1,645,802,316 දක්වා අඩු වී තිබුණි. 2005 ඔක්තෝබර් 19 සිට දෙසැම්බර් 31 දක්වා වූ දින 73 ක කාලපරිච්ඡේදය තුල ලබා තිබූ ලාභය රු.117,127,676 ක් විය.

3.1.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාපනය කළ දිනට එනම් 2005 ඔක්තෝබර් 19 දිනට පවරාගත් බස් සමාගම් 11ක නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය සහ සේවක කොටස් ප්‍රාග්ධනය මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 4,993,886,870 ක් වූ නමුත් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලේඛන අනුව රු. 4,356,035,020 ක් වීමෙන් රු.637,851,850 ක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලේඛන අනුව :		
- සේවකයින්ට නිකුත් කළ කොටස් ප්‍රමාණය	41,114,447	
- භාණ්ඩාගාරයට නිකුත් කළ කොටස් ප්‍රමාණය	394,489,055	
කොටස් වල මුළු එකතුව		435,603,502
-රු.10 බැගින් වූ කොටස්වල නාමික අගය		රු.4,356,035,020
2005 ඔක්තෝබර් 18 දිනට බාහිර විගණකගේ වාර්තා අනුව කොටස්වල නාමික අගය		රු.4,993,886,870

වෙනස		රු.637,851,850

(ආ) විලියන් ගිණුම් සම්පතයාන්ට ගෙවිය යුතුව 2005 දෙසැම්බර් 31 දිනට වූ රු.මිලියන 25,771,692 ක සමුච්චිත පාඩුවෙන් විදිනට පැවති කොටස් ප්‍රාග්ධනය හා සංචිත වලට එකතුව වූ රු. මිලියන 16,982.029 ක් ශේෂ ලෙස දක්වා ඇති අතර, මේ සඳහා භාණ්ඩාගාරයේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඇ) 2006 දෙසැම්බර් 31 දිනට පිළියෙළ කරන ලද අවසාන ගිණුම් අනුව සොරගෙන යන ලද වැට කොට තැබීම් ගිණුමකින් 1996 වර්ෂයේ සිට 2005 ජනවාරි 18 දින දක්වා පොරොත්තු රු.35,751,493 ක වටිනාකමක් ඉදිරියට ගෙනවිත් තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.7,705,028 ක සොරගෙන යන ලද වැට ගෙයින් ඇතුළත්ව සොරගෙන යන ලද වැට ගිණුමේ ඉදිරියට ගෙන විත් තිබූ ශේෂයේ එකතුව රු.43,456,521 ක් විය.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයෝ කරනු ලැබේ.

(අ) 1958 වර්ෂයේදී බස් සමාගම් ජනසතු කිරීමේදී අත්පත් කර ගන්නා ලද ඉඩම් වෙනුවෙන් රු.8,299,517 ක් වූ අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. එම ගනුදෙනුවේදී ඉඩම් වල මුළු වටිනාකම් අයිතිකරුවන්ට නොගෙවීම හේතුවෙන් ඒවායේ අයිතිය ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය වෙත පවරා ගැනීමට නොහැකිව තිබුණි. එම හේතුව නිසා වර්ෂ 49 කට අධික කාලයක් තුළ මෙම ගෙවන ලද මුදල අත්තිකාරමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. මෙම ඉඩම්වල පිහිටීම හා අයිතිය පිළිබඳව සොයාබලා ඉඩම් පවරා ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ලියාපදිංචි කර නිරවුල් කර ගැනීමට සංස්ථාපනය කිරීමෙන් පසුවවත් කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලය සතු එකතුව රු.22,960,405ක්වූ තැන්පතු වර්ග 04 ක් 1985 වර්ෂයේ සිට වර්ෂ 20 කට අධික කාලයක් තුළ නිරවුල් නොකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2004 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාල වල සේවකයින්ගේ වැටුපෙන් අයකර නිරවුල් කිරීමේ පදනම මත සුභසාධන අරමුදලට ගෙවා තිබුණු රු.3,403,534 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. එම අරමුදලට රු.537,781 ක මුදලක් සේවකයින්ගේ වැටුපෙන් අයකර ගෙන තිබූ අතර එම මුදල් අයකිරීම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඈ) සේවකයින් විසින් මණ්ඩලයේ පරිපාලක කාමරයක් ලබාගන්නා ලද ණය වර්ග කිහිපයක් වෙනුවෙන් මාසිකව වැටුපෙන් අයකර ගනු ලැබූ එකතුව රු.139,432,115 ක මුදලින් ඉකුත් වර්ෂවල හා සමාලෝචිත වර්ෂයේදී අරමුදලට ප්‍රේෂණය කර නොතිබුණි.

3.2.2 <u>නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්</u>

ගරහිත බස්රථවල හා ගරහිත අතිරේක වාහනවල වටිනාකම් පිළිවෙලින් රු.145,577,126 ක් හා රු.1,057,421 ක් වශයෙන් එකතුව රු.146,634,547 ක් වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති අතර, එම ගරහිත වාහන අපහරණය කිරීමට හෝ නැවත ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් වී නොතිබුණි.

3.2.3 <u>දඩ ගාස්තු පාඩු</u>

(අ) සේවක භාරකාර අරමුදලට නියමිත කාලය තුළ සේවක දායක මුදල් බැර නොකිරීම හේතුවෙන් ආයතන හා පරිපාලන වියදම් යටතේ රු.1,018,730 ක මුදලක් ප්‍රාදේශීය කාර්යාල හා ඩිපෝ මගින් සමාලෝචිත වර්ෂයේදී අධිභාර ලෙස ගෙවා තිබුණි.

(ආ) අර්ථසාධක අරමුදල් දායක මුදල් නියමිත කාල සීමාව තුළ බැර නොකිරීම හේතුවෙන් 2006 දෙසැම්බර් 31 දිනට ඩිපෝ වෙනුවෙන් රු.5,765,022 ක් සහ ප්‍රාදේශීය කාර්යාල වෙනුවෙන් රු.1,000 ක් ලෙස එකතුව රු.5,766,022 ක මුදලක් අධිභාර ලෙස ගිණුම්වල ප්‍රතිපාදනය කර තිබුණි.

4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු සම්බන්ධයෙන් වරින්වර ආයතනයේ සභාපතිවරයා වෙත වාර්තා කර තිබූ අතර පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම්
(ආ) තොග පාලනය
(ඇ) ණයගැතියෝ හා ණය හිමියෝ
(ඈ) ප්‍රධාන ලෙජරය පවත්වා ගෙනයාම
(ඉ) ගිණුම් ශේෂ සැසඳුම් සකස්කිරීම හා නිරවුල් කිරීම
(ඊ) සංස්ථාපනයේදී පවරාගත් ආයතනවල වත්කම් හා වගකීම් නිවැරදිව හඳුනාගැනීම

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති